Copyrighted Material

# JAMES ROLLINS

Can you crack this unholy conspiracy?

# මැප් ඔෆ් බෝන්ස්

MusesBooks®

පරිවර්තනය
**පාලිත ජයකොඩි**

MusesBooks
www.musesbooks.com

Copyrighted Material

එවක (1159-67 දක්වා කාලය තුළ) කොලෝනයේ අග්‍රරාජගුරු ප්‍රසාදීන් වූ, 'රෙනල්ඩ් වන් ඩසල්' වෙත මේ පූජනීය ධාතු පිරිනැමෙන්නේ බාබරෝසා අධිරාජ්‍යයා මිලාන් නගරය කොල්ලකෑමෙන් අනතුරුවය. ජර්මානු අග්‍රරාජගුරු ප්‍රසාදීන්ට එබඳු මහානුභාවසම්පන්න නිධානයක් - වස්තුවක්, ලැබෙන්නේ එවක සිටි අධිරාජ්‍යයාට ඔහු විසින් කෙරුණු ආධාර, උපකාර සහ උපදෙස් යනාදියට හිලව් වශයෙනි. ඒසා පහසුවෙන්... එබඳු උත්තරීතර වස්තුවක් ඉතාලි බිමෙන් පිටව යන්නට ඉඩහරින්නට කිසිවෙකු කැමති වූයේ නැත.

MusesBooks®

*-From L'histoire de la Sainte Empire Romaine*
*(The History of the Holy Roman Empire), 1845,*
*HISTOIRES LITTÉRAIRES*

www.musesbooks.com

Copyrighted Material

# ප්‍රස්තාවනාව

නායක බිෂොප්වරයාගේ මිනිස්සු පහතින් පිහිටි නිම්න භූමියේ අඳුරු සෙවණැලි තුළට වැදුණෝය. ඔවුනට පිටුපසින් තිබුණු සීත සෘතුවේ කඳු මුඳුන්වලට ඉහළින්, ඊතල පහර කෑමෙන්ද, ඉරී කැපී යෑමෙන්ද වේදනාවට පත් අශ්වයන්ගේ මරහඬ ඇසිණි. මිනිස්සු කෑගැසුවා, හඬා වැලපුණා පමණක් නොව, බෙරිහන් හඬක්ද නැගුවෝය. වානේ එකට ගැටුණු හඬ නැඟී ආයේ දේවස්ථාන සීනු හඬක් මෙනි.

එහෙත් ඒ සිදුවෙමින් තිබුණේ දේවකාරියක් නම් නොවේ.

පසුපෙළ ආරක්ෂකයන් තවදුරටත් බර දරා සිටිය යුතු විය.

ශ්‍රමණ යෝකිම් ඉතා තදින් තෝන් ලණුව අල්ලාගෙන සිටියේ තද බෑවුම දිගේ පහතට ඇදෙමින් සිටි අශ්වයාගේ පිටින් ලිස්සා නොවැටෙනු පිණිසය. බර පටවන ලද කරත්තය මේ වනවිටත් නිරුපද්‍රිතව නිම්න බිමෙහි පහත කෙළවරට ළඟා වී තිබිණි. එහෙත්, සැබෑ ගැලවිල්ල තිබුණේ තවත් ගව්වක් පමණ වූ එපිටකිනි.

*යන්තමින් එහි ළඟාවී ගන්නට ඉඩක් ලදොත් පමණක්...*

දැතින්ම තෝන් ලණුව තදින් අල්ලාගත් යෝකිම්, නිම්න බිම පතුල දෙසට ගැහෙමින්ද පැකිළෙමින්ද ඇදුණු සත්වයාට සන් කරමින් සිටියේය. අශ්වයා, හිම දිය ගැලූ ගඟිත්තක දිය විසුරුවා හරිමින් ඒ හරහා අනෙක්පසට පනිද්දී, යෝකිම් අසුපිට මත හිඳිමින්ම මහත් අසීරුවෙන් ආපසු හැරී බැලුයේය.

MusesBooks®

www.musesbooks.com

Copyrighted Material



වසන්තය උදා වී තිබුණු නමුදු තවමත් උස්බිම්වල රජකළේ ශිශිරයයි. කඳු මුඳුන් හිරු එළියෙන් බැබළෙමින් තිබුණේ දීප්තිමත්වය. කඳු මුඳුන්වල තියුණු තුඩුවලින් පහතට එල්ලාවැටුණු හිම පදාස, හිරු එළිය සතර අතට විහිදා පතුරා හැරියේය. එහෙත් කඳු මුඳුන්වල සෙවණැල්ලට යටවුණු දොරු පෙදෙස්වල හිම දියව යන්නට පටන්ගෙන මඩ-හෙල් බවට හැරී තිබුණේය. කුර හන්දි දක්වාම මඩේ එරුණු අශ්වයන් ඉතා වේගයෙන් ඉදිරියට පිම්මේ ඇදුණේ දැන් දැන් උන්ගේ දෙපා බිඳී යතියි බිය උපදවන අන්දමිනි. ඉදිරියෙන් ඇදුණු කරත්තය එහි ඇක්සලයේ කෙළවර දක්වාම පාහේ මඩේ එරී තිබුණේය.

යෝකිම් තම අශ්වයාට සන්කළේ පය ඉක්මන් කර ඇදී, කරත්තය අසල රැඳී සිටි සෙබළුන් අසලට ළංවනු පිණිසය.

දැන් තවත් අශ්වයන් කණ්ඩායමක් රථයෙහි ඉදිරිපසින් ඈඳා තිබිණි. මිනිස්සු පිටුපසින් තල්ලුව දුන්නෝය. කොයියම් ආකාරයකින් හෝ ඊළඟ කඳු මුඳුන අද්දර පිහිටි වන මඟ දක්වා එය තල්ලු කරගෙන යා යුතු විය.

"ඒ... යා..!" කරත්තකරුවා බිරුසන් දුන්නේ සට-පට ගා කසය වනමිනි.

තම හිස මඳක් පසුපසට ගැස්සූ ප්‍රධාන අශ්වයා අසීරු උත්සාහයක යෙදුණේ වියගහට මුළු බර දෙමිනි. අමුතු යමක් සිදුවූයේ නැත. ඇදුණු දම්වැල්වල පීඩාව දරාගත් අශ්වයන් ශීත වාතාශ්‍රයට සුදු පැහැ ප්‍රශ්වාසයක් පිටකරද්දී, මිනිස්සු නොසරුප් හා නින්දිත දිවුරුම් හඬ, සාප හඬ නැගුවෝය.

හෙමි හෙමින්, ඉතා හෙමින් කරත්තය මඩින් මිදී ඇදී ආයේ, ළය කුහරය විවර කරමින් හටගත් යම් තුවාලයකින් නැගෙන්නාක් බඳු වූ හඬක් නංවමිනි. එහෙත්, අන්තිමේදී දැන් එය ඉදිරියට ඇදෙන්නට පටන්ගෙන තිබිණ. ප්‍රමාද වන සෑම තත්පරයකටම පාහේ වන්දි ගෙවන්නට සිදුව තිබුණේ ලෙයිනි. ඔවුනට පසුපසින්, ඈතින් නැඟී ආයේ මරණීය අඳෝනාවේ හඬය.

*පසුපෙළ තවත් සුළු වෙලාවක් අල්ලා - දරාගෙන සිටිය යුතු විය.*

කරත්තය නැවතත් ඉදිරියට ඇදුණේ කන්ද නඟිමිනි.

කරත්තයේ තට්ටුව මත තැන්පත් කර තිබුණු විසල් ශෛලමය ශව මංජුසා[1] තුනක් ඒවා ගැටගසා තිබුණු රැහැන්වලින් බැඳී යළි යළිත් හොඳාකාරව හිර වී ගොස් තිබුණේය.

1 *stone sarcophagi*

www.musesbooks.com

Copyrighted Material



*ඉන් එක් රැහැනක් හෝ බිඳී ගියේ නම්...*

ශ්‍රමණ යෝකිම්, අසීරුවෙන් ඉදිරියට ඇදෙමින් තිබුණු මේ කරත්තයට කිට්ටු කළේය.

ඔහුගේ සහෝදර ශ්‍රමණ ෆ්‍රාන්ස්ද සිය අශ්වයා ඒ අසලට මෙහෙයවීය. "ඔත්තුකාරයෝ කී විදිහට ඉදිරියෙන් නම් කිසිම කරදරයක් සිද්දවෙන පාටක් නැහැ."

"කොයිවිදිහකින්වත් මේ පූජනීය භස්මාවශේෂ ආපහු රෝමයට ගෙනියන්න දෙන්නට නම් බැහැ. කොහොමහරි ජර්මානු දේශසීමාවට සේන්දු වෙන්නට ඕනෑ."

ෆ්‍රාන්ස් හිස සැලූයේ එය අවබෝධකරගත් බවක් හඟවමිනි. මේ භස්මාවශේෂ ඉතාලි බිම තුළ කොහොමටවත් ආරක්ෂිත නොවූ අතර, සැබෑ පාප්වහන්සේ ප්‍රංශයට පිටුවහල්ව සිටියදී - ව්‍යාජ පාප්වහන්සේ නමක් රෝමය තුළ වැඩවසද්දී, එය සැබැවින්ම අනාරක්ෂිත විය.

කරත්තය දැන් පෙරටත් වඩා ඉක්මනින් ඉදිරියට ඇදුණේ වඩා විශ්වාසවන්ත අන්දමිනි. එසේ වුවද තවමත් එය මිනිසෙකු පයින් ගමන් කළ වේගයට වඩා වැඩි වේගයක් පෙන්නුවේ නැත. සිය අශ්වයාගේ පසුපස පෙදෙසට ඉහළින් බැලූ යෝකිම් නොනවත්වාම නෙත් යොමා සිටියේ ඈත කඳුවැටිය දෙසටය.

සටන් හඬ දැන් දැන් ගෙරවුම් සහ ඉකිබිඳීම් බවට පත්ව, නිම්නය හරහා වේදනාකාරීව රැව් පිළිරැව්දෙමින් තිබිණි. කඩුපත් එකට වැදෙන හඬ මුළුමනින්ම පාහේ නතර වී ගොස් තිබුණේ, පසුපෙළ ආරක්ෂක වළල්ලේ පරාජය සංඥා කරන්නාක් මෙනි.

යෝකිම් වඩා උනන්දුවෙන් බැලූ නමුත්, උස්බිම් වසාගත් අඳුරු සෙවණැලිවලට වඩා යමක් දැකගත හැකිවූයේ නැත. අනෙක්අතට උසට උසේ වැඩුණු පයින් ගස් යායද සියල්ල අවුරා, හංගා දමා තිබිණි.

එක්වනම රිදී පැහැ දිලිසුමක් යෝකිම්ට දැකගන්නට ලැබුණේ මෙවේලෙහිය.

දිලිසුම් දුන් සන්නාහයෙන් යුතු, එක්තරා තනි රුවක් හිරු එළිය අතරින් මතුව ආයේය.

ඒ කළු පාප්වහන්සේගේ සේනාපතිවරයෙකු බැව් හඳුනාගන්නට, ඔහුගේ ළය මත සටහන්ව තිබුණු රක්ත වර්ණ මකර රුව දැකගැනීම යෝකිම්ට ඇවැසි නොවූයේය. මේ දුෂ්ට අරාබිකාරයා, ගාලමේයින් යටතේ සිටි වීරවරයෙකුගේ නාමය වූ ෆයිරබ්‍රස් යන නාමය ආරූඪ

www.musesbooks.com

Copyrighted Material



කරගෙන සිටියේය. තම පිරිසේ කාටත් වඩා උසින් යුතු වූ හෙතෙම, උසට උසේ සිටගෙන සිටියේය. හේ සැබැවින්ම දැවැන්තයෙක් විය. වෙන කාටත් වඩා කිතුනු රුධිරය තැවරී තිබුණේ ඔහුගේ දෑත්වලය. එහෙත් පසුගිය වසරේදී බවුතීස්ම ලද ඔහු දැන් පක්ෂපාතව සිටියේ, හතරවැනි වික්ටර් නමින් අභිෂේක වූ කළු පාප්වහන්සේ, එනම් කාදිනල් ඔක්ටේවියස්ටය.

ෆයිරබ්‍රස් ඒ හිරු එළිය පැල්ලම මැද හිටගෙන සිටියේ හඹා එන්නට කිසිදු අභිප්‍රායක් නැත්තෙකු මෙනි.

තමා දැන් බොහෝ ප්‍රමාද බැව් අරාබිකාරයා දැනසිටියේය.

ඒ වනවිටත් කරත්තය කන්ද නැග, ඒ මුඳුනින් ඇදුණු, රෝදවලට හැරුණු වියළී ගිය වන මඟට වැටී තිබිණි. එයින් පසු එහි වේගය තවත් වැඩිවන්නට ඉඩ තිබිණි. ජර්මානු බිම පිහිටා තිබුණේ මෙතැන් සිට තවත් ගව්වක් පමණ වූ දුරකිනි. අරාබිකාරයාගේ ප්‍රහාරය ව්‍යර්ථව ගොස් තිබිණි.

යම් එහාමෙහා වීමක්, චලනයක් යෝකිම්ගේ අවධානය දිනාගත්තේය.

ෆයිරබ්‍රස් තම උරහිසට ඉහළින් ඇදගත්තේ, ඒ සෙවණැල්ලේ අන්ධකාරය තරම්ම කාළ වර්ණයෙන් යුත් දැවැන්ත ප්‍රමාණයේ දුන්නකි. හෙමි හෙමින් එහි වරපට මත ඊයක් තබා පසුපසට කොට අල්ලාගත් හේ, පසුපසට නැවී වැර යොදා ඇද්දේය.

යෝකිම් නළල රැලිගන්වා ගත්තේය. මේ එක ඊතලයකින් මේ මිනිහා මොන ඉලව්වක් දිනාගන්නද හදන්නේ?

දුන්න ඇඹරී ගියේ එයින් මිදුණු හීය, ආරුක්කු හැඩයකට ඉහළ අහසට නැගුණේ, තවත් මොහොතකින් කඳුවැටියට එපිටින් ගලා ආ හිරු එළියේ සැඟවී ගියේය. යෝකිම් ගුවන සිසාරා තම දෙනෙත් විහිදූයේ මහත් පීඩාකාරී හැඟීමකින් යුතුවය. ඉනික්බිති, පොළොවට කඩාපාත්වන්නා වූ උකුස්සෙකුගේ නිහඬ ලීලාවෙන් බිමට පහත් වුණු හීය, කරත්තය මත තිබුණු ශව මංජුසා අතරින් හරි මැද තිබුණු මංජුසාවේ හෙවත් ගල් මිනීපෙට්ටියේ වැදුණේය!

අකුණක හඬක් නඟමින් ඒ ගල් මිනීපෙට්ටියේ පියන පුපුරා ගියේ ඇදහිය නොහැකි අන්දමිනි. ඇහුරුම් පෙට්ටිය පැළී විවර වී ගිය සැණින්, ඒවා බැඳ දමා තිබුණු රැහැන්පටිද කැඩී ගියේය. බැඳුණු රැහැන්වලින් නිදහස් වූ ගල් මිනීපෙට්ටි තුන, දැන් කරත්තයේ විවර වී තිබුණු මැත කෙළවරට ලිස්සා යන්නට විය.

www.musesbooks.com

Copyrighted Material



මිනිසුන් වහා ඉදිරියට දිවගියේ ඒවා බිම වැටී කුඩුපට්ටම්ව යාම වළක්වා ගැනීමේ අරමුණින් යුතුවය. අත් කීපයක්ම ඒ වෙනුවෙන් එහි දිගු විය. කරත්තයේ ගමන නතර විය. එහෙත් ඒ වනවිටත් එක් ඇසුරුම් පෙට්ටියක් අනෙක්වාට වඩා ඉක්මනින් ලිස්සා ඇදී ආයේය. අනෙක්අතට පෙරළුණු එය, යටින් සිටි සෙබළෙකු මත ඇදවැටුණේ ඔහුගේ පාදයක උකුල් ඇටයක් බිඳ දමමිනි. අසරණයාගේ මරු විලාපය ගුවන වසාගත්තේය.

ෆ්‍රාන්ස් වහවහා එහි පැමිණියේ සැදලයෙන් බිමට පනිමිනි. ඒ, අසරණයාගේ සිරුර මතින් මහ බරැති ගල් පෙට්ටිය ඔසොවන්නටම නොව, ඊටත් වඩා එය යළි කරත්ත තට්ටුව මත තබාගන්නට වෑයම් කළ පිරිසට උදව්කරනු පිණිස එක්වන්නටය.

ගල් මිනීපෙට්ටිය ඉහළට එසවී යාමත් සමග මිනිසා ඒ යටින් ඉවතට ඇදීගත්තේ නමුදු, කරත්තයේ තට්ටුව මතට යළි ඔසොවා ගන්නට නොහැකි තරම් එය බරින් වැඩි විය.

**"කඹ!"** ෆ්‍රාන්ස් මොරදුන්නේය. **"අපට කඹ ඕනෑ!"**

ගල් මිනීපෙට්ටිය ඔසොවාගෙන සිටියවුන්ගෙන් එකෙක් ලිස්සා ගියේය. නැවතත් එය බිම ඇදවැටුණේ එක් ඇලයකටය. ගලින් කළ පියන ගැලවී වැටුණේය.

අසු-කුර ගැටෙන හඬක් පිටුපසින් ළඟ ළඟම ඇසෙන්නට විය. *වන මංපෙත දිගේ. ඉතා වේගයෙන්.* යෝකිම් ආපසු හැරී බැලුවේ දැන් දැන් දකින්නට නියත දේ කුමක්දැයි දැනසිටි බැවිනි. හිරු එළියට දිදුලමින්, කටින් පෙණ වගුරමින් දිවආ අසුන් ඔවුන් වෙත කිට්ටුකරමින් තිබිණි. ගව්වකින් සතරෙන් එකක් පමණ දුර සිටියදීම දැකගන්නට ලැබුණේ මේ අසරු සේනාවම කාළ වර්ණයෙන් සැරසී සිටි අන්දමය. *අරාබිකාරයාගේ මිනිසුන් තව තවත්!* මේ දෙවැනි හදිසි ප්‍රහාරය විය.

යෝකිම් තම අශ්වයා මත ඔහේ හිඳගෙන සිටියේය. දැන් ගැලවිල්ලක් නොලැබෙන බැව් නියත විය.

මෙවේලෙහි ෆ්‍රාන්ස් මහ හුස්මක් ඉහළට ඇදගත්තේය. ඒ, ඔවුන් මුහුණදෙන්නට යන අකරතැබ්බය නිසා නොව, ගල් මිනීපෙට්ටිය ඇතුළේ තිබුණු දේ දැකීමෙනි. වඩාත් නිවැරැදිව කියතොත්, ඒවායේ කිසිවක්ම නොතිබීම හේතුවෙනි.

**"හිස්!"** තරුණ ශ්‍රමණයා කෑගැවේ විස්මයෙනි. **"ඒක හිස්!"**

www.musesbooks.com

Copyrighted Material



මේ කම්පනය ෆ්‍රාන්ස් යළි පියවි ලෝකයට ගෙන ආවේය. කරත්තයේ තට්ටුවට වහා පැනගත් හේ, ඊතල වැදීමෙන් පුපුරාගිය පියනින් යුත් අනෙක් ගල් මිනීපෙට්ටිය දෙස විපරම් බැල්මක් හෙළුයේය.

**"මේකෙත් ඇති දෙයක් නැහැ!"** ෆ්‍රාන්ස් කීවේ දණින් වැටෙමිනි. **"පූජනීය භස්මාවශේෂ? මේ මොන ඉලව් භස්මාවශේෂයක්ද?"** තරුණ ශ්‍රමණයා යෝකිම්ගේ දෑස දෙස බැල්මක් හෙළුයේ නමුදු, ඒ දෙනෙතේ ඔහු අපේක්ෂා කළ තරමේ පුදුමයක් හෝ කම්පාවක් හෝ නොතිබිණි. **"ඔහේ මේ ගැන දැනගෙනයි හිටියේ!"**

යෝකිම් යළිත් එක පිම්මේ එන අසරුවන් දෙස බැල්මක් හෙළීය. ඔවුන්ගේ තවලම මුළුමනින්ම පාහේ ප්‍රයෝගයක්, කළු පාප්වරයාගේ මිනිසුන් රවටන්නට කළ උපායක් පමණක් වීය. කොටළුවන්ගෙන් සැදුම්ලත් නඩයක් සමඟ මීට දිනකට පෙරාතුව පිටත්ව ගොස් තිබුණු සැබෑ දූතයා, දළ පිළියෙන් ඔතා පිදුරු අට්ටියක සඟවන ලද සැබෑ භස්මාවශේෂ රැගෙන ගොස් තිබිණි!

යෝකිම් ආපසු හැරුණේ මිටියාවත හරහා ෆයිරබ්‍රස්ගේ සේන්දුවීම දැකගන්නටය. අරාබිකාරයා අද වියරු වැටෙන්නට ඉඩ තිබුණු නමුත්, කළු පාප්වරයාට කවර කලෙකවත් භස්මාවශේෂ ලබාගන්නට නොහැකි බැව් නියත විය.

*කිසි කලෙකවත්!*

**වර්තමානය**
**ජූලි 22, ප.ව. 11:46**
**කොලෝනය, ජර්මනිය**

මැදියම් රය ළඟාවෙත්ම ජේසන් තම අයි-පෑඩය මැන්ඩි අත තැබීය. "අහන්න. මේ තමයි ගෝල්ඩ්ස්මැක්ගේ අලුත්ම සින්දුව. තාම අමෙරිකාවෙවත් රිලීස් වෙච්ච එකක් නෙවෙයි. නියමයි නේද?"

ඇගේ ප්‍රතිචාරය ජේසන් බලාපොරොත්තු වූ තරමින් නොවූයේය. හැඟීම් විරහිත අන්දමින් දෙවුර සැලූ නමුදු, ඇය තමා වෙත දිගු වී තිබුණු ඉයර්ෆෝන් යුගලය අතට ගත්තාය. රෝස පැහැයෙන් කෙළවර වර්ණගැන්වූ කළු කෙස්රොද පස්සට තල්ලු කළ ඇය, ඒවා සිය දෙකනේ ඔබාගත්තාය. මේ හරිබරිගැහිල්ලේදී විවර වී ගිය ඇගේ කබා කට අතරින්, කළු පැහැ පික්සීස් ටී-ෂර්ටයට තද වී,

MusesBooks®
www.musesbooks.com

Copyrighted Material



මතු වී පෙනුණු ඇපල්ගෙඩි තරම් වූ ඇගේ දෙපියයුරු මොහොතකට නිරාවරණය විය.

ජේසන් එදෙස බලාසිටියේ අයාගත් දෙනෙතින් යුතුවය.

"මට නම් කිසිදෙයක් ඇහෙන්නෙ නැහැ," විඩාබර ලෙස හුස්මක් පිටකළ මැන්ඩි කීවේ නළල රැලිගන්වා ජේසන් දෙස බලමිනි.

ඔහ්! වහා යළි සිහි එළවාගත් ජේසන්, තම අයි-පෑඩය වෙත නෙත් යොමුකළේ, එහි 'ප්ලේ' බොත්තම එබීය.

දෙඅත් හිස පිටිකර බැඳගත් හේ පසුපසට ඇල වූයේය. ඔවුන් දෙදෙනා දැන් මේ හිඳගෙන සිටියේ *Domvorplatz* නමින් හඳුන්වන එළිමහන් පදික චතුරස්‍රයක් වටකොට තනන ලද තුනී තණපලසක් මතය. එය පිහිටා තිබුණේ *කෝල්නර් ඩෝම්* නමින් හඳුන්වන්නට යෙදුණු, ගොතික් සම්ප්‍රදාය අනුව ඉදිකෙරුණු ආසන දෙව්මැඳුරක් වටාය. එය දෙව්මැඳුරට අයත් උස් බිමෙහි පිහිටා තිබුණෙන්, එතැනට මුළු නගරයම පාහේ හොඳහැටි දර්ශනය විය.

ශෛලමය රුවලින් හැඩවැඩ කෙරුණු, ධර්මය පිළිබඳ කාරණාවල සිට අද්භූත දේ දක්වා පුළුල් පරාසයක පැතිරුණු, පෙළින් පෙළට කිරිගරුඬින් කැටයම් කරන ලද සම-උස් නිවුන් උල්-කොත් දෙකට ජේසන්ගේ දෑස් දිවීය. මහ රාත්‍රියේ ආලෝකමත්ව තිබුණු එයින් පළවූයේ මෙලොවට කිසිම සම්බන්ධයක් නැති, ගැඹුරු පාතාල ලෝකයෙන් නැඟී ආ පෞරාණික යමකින් උපන් අද්භූත හැඟුමකි.

අයි-පෑඩයෙන් යන්තමින් කාන්දු වූ සංගීත රාවයට කන්දීගෙනම හේ මැන්ඩි දෙස බලාසිටියේය. ඔවුන් දෙදෙනාම තම බොස්ටන් විද්‍යාලයීය ගිම්හාන නිවාඩුව අතරතුර මේ ගමන්කරමින් සිටියේ ජර්මනියත් ඔස්ට්‍රියාවත් හරහාය. ඔවුන් බ්‍රෙන්ඩා හා කාල් නමින් හඳුන්වන ලද තවත් මිතුරන් දෙදෙනෙකු සමඟ මේ සංචාරයේ යෙදෙමින් සිටියේ නමුදු, ඒ දෙදෙනා රාත්‍රී දේවමෙහෙයට සහභාගි වීමට වඩා, ඒ ඉසව්වේ පිහිටි අවන්හල් ගැන සොයාබලන්නට මනාප වූවෝය. එසේ වුවද මැන්ඩි ඇතිදැඩි වී තිබුණේ රෝමානු කතෝලික පරිසරයක් තුළය. එබැවින් වසරේ තෝරාගත් නිවාඩු දිනවලදී පමණක්, අගරදගුරුතුමාගේ සහභාගිත්වයෙන්, මේ ආසන දෙව්මැඳුරේ පවත්වන්නට යෙදෙන මැදියම් රෑ දේවමෙහෙයවලින් එකක් වන 'රජවරුන් බැහැදැකීමේ මංගල්‍යය' මඟහැරගැනීමේ කිසිදු වුවමනාවක් ඇය සතු වූයේ නැත.

MusesBooks®

www.musesbooks.com

Copyrighted Material



ප්‍රොතෙස්තන්ත කිතුනුවකු වූයේ නමුදු, ජේසන් ඇය සමඟ මේ ගමන යන්නට මනාපය පළකොට තිබිණි.

මැදියම් රැය උදාවන තෙක් මෙසේ කල්මරද්දී සංගීත රාවයට අනුව මැන්ඩිගේ හිස යන්තමින් ඉහළ පහළ යමින් තිබිණි. නළලත වැටුණු කෙස්රොද ඒ රිද්මයට අනුව සෙමින් නැටූ අයුරුත්, සංගීතයට ඒකාග්‍ර කරගත් සිතින් යුතුව ඈ තම යටිතොල උල්කරගෙන සිටි අයුරුත් ජේසන්ගේ මනාපයට හේතු වී තිබිණි. එක්වරම ඔහුට දැනුණේ ස්පර්ශයකි. මැන්ඩි තම අත දිගු කර තිබුණේ, ඇගේ අත ඔහුගේ පිටිඅත්ලෙහි යන්තම් වැදී යන අන්දමිනි. එහෙත් ඇගේ දෙනෙත් ඒ වනවිටත් එක එල්ලේ යොමුව තිබුණේ දෙව්මැඳුර වෙතටය.

ජේසන් බලාසිටියේ නොඉවසිල්ලෙනි.

ගෙවුණු දින දහය මුළුල්ලේම දෙදෙනා'තර වඩ වඩාත් සමීප බවක් දෙදෙනාටම දැනී තිබිණි. මේ සංචාරය ආරම්භයේදී දෙදෙනා අතර තිබුණේ යම් දැනහැඳුනුම්කමක් පමණි. මැන්ඩි, බ්‍රෙන්ඩාගේ හොඳම මිතුරිය වූ අතර කාල්, ජේසන්ගේ කාමර සගයා විය. ජේසන්ගේ සහ මැන්ඩිගේ යහළුවන් දෙදෙනා වූ අලුත් ආදරවන්තයන් තනි තනිව මේ ගමන යන්නට අකමැතිව තිබුණේ, දලු ලා නැග ආ මේ ආදර සම්බන්ධය තුළ කිසියම් නුරුස්නා බවක් වැනි යමක් හටගනු ඇතිදැයි කල්පනා කළ බැවිනි.

එහෙත් එබඳු කිසිවක් සිදු වී තිබුණේද නැත.

මේ හේතුව නිසාම, නගර-සිරි බලනු පිණිස නිතරම පාහේ එක්ව යන්නට සිදුවුණේ මැන්ඩිටත් ජේසන්ටත්ය.

එහෙත් ජේසන් එය කරදරයක් ලෙස සැලකුයේ නැත. ඔහු විද්‍යාලයේදී ඉගෙනගනිමින් සිට තිබුණේ ඉතිහාසයයි. යුරෝපීය අධ්‍යයනය මැන්ඩිගේ ප්‍රධාන විෂය විය. නීරස පෙළපොත්වල තිබුණු විෂය කරුණුවලට යම් වැදගැම්මක් හා හරයක් ලැබුණේ මෙහිදීය. එක හා සමාන ගවේෂණාත්මක ආස්වාදයකින් යුතු වූ දෙදෙනා ඔවුනොවුන් ගැන කල්පනා කළේ තමන් කදිමට පෑහෙන ගමන් සගයන් බවය.

ඇගේ ස්පර්ශය වෙතින් තම දෑස් මුදවාගෙන සිටි නමුදු හේ තම එක් ඇඟිල්ලක් ඇය වෙත වඩාත් කිට්ටු කළේය. මේ රාත්‍රිය එක්වරම වඩා අලංකාර වන්නට සැරසුණාවත්ද?

අවාසනාවකට මෙන් ගීතය ඉතා ඉක්මනින්ම අවසන් විය. මැන්ඩි සිය කය ඍජු කර හිඳගත්තේ, ඉයර්ෆෝන් දෙක ගලවා ගන්නට තම දෙඅත දිගු කරමිනි.

MUSESBOOKS®

www.musesbooks.com

Copyrighted Material



"අපි ඇතුළට යන්න ඕනෑ," ඇය මිමිණුයේ විවර වූ දෙව්මැඳුරු දොරටුව හරහා ඇතුළට ඇදෙමින් සිටි මිනිසුන් පේළිය දෙසට හිසින් සන් කරමිනි. ඉනික්බිති නැගිටගත් ඇය, අර අලංකාර ටී-ෂර්ටයට පිටින් ඇඟලාගෙන සිටි, සාම්ප්‍රදායික කළු ඇඳුමේ ජැකට්ටුවේ බොත්තම් පියවන්නට පටන්ගත්තාය.

ඇය තම ඇස්වටය දක්වාම දිගට ඇදුණු සායේ රැලි කඩා, දෙකනට පිටින් වැටුණු රෝස පැහැ කෙළවරින් යුතු කෙස්රොදේ අවුල් හරිද්දී ජේසන්ද ඇයට එක්වීය. දඟ වැඩ ඇති සරසවි සිසුවියකගේ සිට, සන්සුන් කතෝලික පාසල් ශිෂ්‍යාවක් බවට ඇය වෙස් පෙරළාගත්තේ එක් ක්ෂණයකිනි.

හිටිහැටියේම සිදු වූ වෙනස ජේසන්ගේ මුව විමතියෙන් විවර කරවන්නට සමත් විය. කළු පැහැති ඩෙනිම් කලිසමකින්ද සැහැල්ලු ජැකට්ටුවකින්ද සැරසී සිටි ජේසන්ට දැනුණේ තමන් මෙතැනට නොගැළපෙන පරිදි හැඳසිටිනා බවකි.

"නෑ, ඔහොම හොඳයි," ඔහුගේ ළතැවිල්ල වටහාගත් මැන්ඩි පැවසුවාය.

"ස්තුතියි!" ඔහු මිමිනීය.

තම අඩුම කුඩුම දෑතට ගෙන, හිස් කෝක් කෑන් අසල වූ කසළ බඳුනකට විසිකර දැමූ ඔවුහු, බිම් ගඩොලු අල්ලන ලද *Domvorplatz* හරහා ඉදිරියට ඇදුණෝය.

"*ගුටන් ආබීස්*[2]" කළු පැහැ ලෝගුවකින් සැරසුණු දේවස්ථාන උපස්ථායකයෙකු දොර අසලදී ඔවුනට ආචාර කළේය. "සාදරයෙන් පිළිගන්නවා!"

"*ඩන්කෙ.*[3]" ඊට පිළිතුරු ලෙස මැන්ඩි මිමිණුයේ තරප්පු පෙළ නගින අතරේය.

දේවස්ථානයේ ද්වාරය හරහා ඇදුණු, එහාමෙහා දැඟලූ ඉටිපහන් ආලෝකය ගලින් කරන ලද පියගැටපෙළ මත වැටී තිබුණේ ඉහළිනි. මේ අමුතු ආලෝකය කාලයත් පෞරාණිකත්වයත් පිළිබඳ හැඟීම් තීව්‍ර කරන්නට හේතු වී තිබිණි. එදා උදයේ, දේවස්ථානය නරඹන්නට ආ ගමනේදී ජේසන් සොයා දැනගෙන තිබුණේ, මේ දේවස්ථානයේ මුල්ගල තබන්නට යෙදී ඇත්තේ දහ තුන්වැනි සියවසේදී බවය. එතරම් විශාල කාලපරාසයක් ගැන ඔහුට සිතාගන්නට පවා නුපුළුවන් විය.

2 සුබ සැන්දෑවක්

3 ස්තුතියි

MUSESBOOKS®
www.musesbooks.com

Copyrighted Material



ඉටිපහන් ආලෝකයේ නැහැවෙමින්, කැටයම්වලින් යුතු දැවැන්ත ද්වාරය අසලට සේන්දු වූ ජේසන්, මැන්ඩි පසුපස ඇදෙමින් ප්‍රවේශ ශාලාවට පිවිසුණේය. පාත්‍රයක තිබුණු ශුද්ධ ජලය ස්පර්ශ කළ ඇ, කුරුස ලකුණ සටහන් කරගත්තාය. ජේසන්ට මෙහිදී යම් නොගැළපෙන බවක් හැඟීගියේ, එය ඔහුගේ විශ්වාසයට පටහැණි වූ බැවිනි. තමා අනවසරයෙන්, නොනිසි තැනකට ඇතුළු වී සිටි සෙයකි ඔහුට දැනුණේ. ඔහු බියවූයේ යම් අතපසුවීමක්, වැරැදීමක් සිදුවුවහොත් එයින් තමා පමණක් නොව, මැන්ඩිද අපහසුවකට, ලජ්ජාවකට පත්වන්නට ඉඩ ඇති බැවිනි.

"මා පස්සේ එන්න," මැන්ඩි පැවසුවාය. "ඉඳගන්න හොඳ තැනක් හොයාගන්න ඕනෑ. ඒත් හුඟාක්ම කිට්ටුවෙන් නම් නෙවෙයි."

ජේසන් ඇය පසුපස ඇදුණේය. දේවස්ථානයට ඇතුළුවීමෙන් පසු, දැන් ඔහු සිත රජකළ විස්මයාවහ හැඟුම අර සන්තාප මුසු හැඟීම යටපත් කර දමන්නට සමත්ව තිබිණි. මේ වනවිටත්, ඊට පෙර වතාවක මෙහි ඇතුළු වී එහි ඉතිහාසයත්, ඉදිකිරීම් විලාස හා ක්‍රමවේද ගැනත් හොඳහැටි අවබෝධයක් ලබාසිටියේ වුව, හේ මේ මහා අවකාශය තුළ උපන් මහේශාක්‍ය බවින් නැවතත් අන්දුන්කුන්දුන් වී සිටියේය. දේවස්ථානයේ ගර්භය ඔහුට ඉදිරියෙන් අඩි හාරසියයක පමණ ඈතට ඇදීගොස් තිබුණු අතර, අඩි තුන්සියයකින් පමණ සමන්විතව හරහා වැටුණු හරස් අංශයත් සමඟින් - සමච්ඡේදක මධ්‍යයේ පිහිටි අල්තාරයත් එක් වූ පසු කුරුසයක ලකුණක්, හැඩයක් මතු වී තිබිණි.

එහෙත් ඔහුගේ විස්මයට හේතු වූයේ මේ දෙව්මැඳුරේ දිග හෝ පළල හෝ නොව, ඇදහිය නොහැකි අන්දමේ උසය. උල් හැඩැති ආරුක්කු මාර්ග, ඉතා උස් කුළුනු මෙන්ම ගෝලාර්ධ පියැසි ඔස්සේ ඔහුගේ දෙනෙත ඉහළින් ඉහළට ඇදුණේය. දහස් ගණනින් දැල්වෙමින් තිබුණු ඉටිපහන්වලින් නැඟුණු සර්පිලාකාර දුම්කැරලි ස්වර්ගය බලා ඇදෙන්නාක් මෙන් ඉහළට නැඟුණේ, දේවස්ථාන බිත්ති මත දඟකරමින්ද වෙවුලමින්ද ඉතා සුගන්ධවත් බවක් උපදවමිනි.

මැන්ඩි, ඔහුව අල්තාරය දෙසට කැඳවාගෙන ගියාය. ඔවුනට ඉදිරියෙන් පිහිටි අල්තාරය දෙපසින් වූ හරස් අංශ රැහැන්පට ඇද අවුරා තිබුණු නමුත්, එහි මැදකොටසට වන්නට හිස් ආසන බොහෝමයක් තිබුණේය.

"කොහොමද මෙතැන? හොඳද?" ඇය ඇසුවේ ප්‍රවේශ මාර්ගයේ අතරමැද මොහොතක් සුනංගු වෙමිනි. ඇගේ මුහුණේ ඇදීගිය

www.musesbooks.com

Copyrighted Material



මඳ සිනහවේ, ස්තුතිපූර්වක බවක් මෙන්ම අඩ ලජ්ජාවක්ද ගැබ්ව තිබිණි.

කාළ වර්ණයෙන් සැරසුණු කන්‍යා මරියතුමියගේ හැඩරුවින් දිස්වුණු ඇගේ සුන්දරත්වයෙන් වශීව ගිය ඔහු, ඊට ප්‍රතිචාර වශයෙන් කළේ මෝඩපහේ හිස සැලීමකි.

ඔහුගේ අතින් අල්ලාගත් මැන්ඩි ආසන පේළියකින් යුතු බංකුවක, බිත්තිය අසලම වූ කෙළවරක් පෙන්නුවාය. ඔහු එහි හරිබරිගැසුණේ නිවීහැනහිල්ලේ ඉන්නට ඉඩක් ලැබීමේ තෘප්තියෙන් යුතුවය.

මැන්ඩිගේ අත තවමත් ඔහුගේ අතේ පටලැවී තිබිණි. ඇගේ අත්ලෙහි වූ උණුසුම ඔහුට දැනිණි.

මේ රාත්‍රිය පැහැදිලිවම ආලෝකවත් වන බැව් නිසැකය.

අන්තයේදී, නැඟී ආ සීනු හඬක් සමඟින් ගීතිකා කණ්ඩායම ඔවුන්ගේ ගායනය පටන්ගත්තේය. ඒ, දේවමෙහෙයේ ආරම්භය විය. ඔහු මැන්ඩි අනුව යමින් කටයුතු කළේය. සැදැහැයෙන් පිරීගිය බැලේ රැඟුමක යෙදෙන්නාක් මෙන් ඇය නැඟී සිටියාය. දණගැසුවාය. හිඳගත්තාය. මේ කිසිවකින් ඔහුට වැදගැම්මක් නැති වූ නමුදු, දැඩි කුතුහලයකින් යුතුව තමා එහි වූ මේ අලංකාරවත් පරිසරයට වශී වී ඉන්නා බැව් වටහාගත්තේය; දේව මංගල්‍යය වෙනුවෙන් දල්වන ලද ඉටිපහන්, ගීතිකා ගැයුමේ යෙදී සිටි පල්ලියේ ගීතිකා කණ්ඩායම හා පල්ලියේ සාමාජිකයන්ද - මේ හැමටමත් වඩා රනින් සැරසුම් කළ උස් පූජක හිස් පලඳනාව හිස පලඳාගෙන එහි පැමිණෙන අගරදගුරුතුමාගේ සම්ප්‍රාප්තිය ඉඟිකරමින්, සුවඳ දුම් ගෝල දෙපසට වනමින් පෙරගමන් ආ කළු ලෝගු හැඳගත් පූජක පිරිසද ඔහුගේ නෙත් සිත් පැහැරගත්තේය.

මෙයට සහභාගි වූවන්ගෙන් මෙන්ම හැම අත දකින්නට ලැබුණු කලාංගයන්ගෙන්ද පෙනුණේ ඒකාකාර උත්සවශ්‍රීයකි. දැවයෙන් කරන ලද, මිලාන් කන්‍යා මරියතුමිය යන නමින් හඳුන්වන ලද මරියතුමියගේ හා ජේසු බිළිඳාගේ පිළිමය පෞරාණික බවේත් කරුණාවේත් ප්‍රතිමූර්තියක් බඳුව දිදුලමින් තිබුණේය. ඊට ප්‍රතිවිරුද්ධ පසින් සාන්ත ක්‍රිස්ටෝපර් මුනිවරයා කුඩා බිළිඳෙකු දෝතින් ඔසොවාගනිමින් මනස්කාන්ත සිනාවකින් මුව සරසාගෙන පසුවිය. ඊට අමතරව, ඊට ඉහළින් දැවැන්ත බවේරියානු වීදුරු කවුළු පිහිටා තිබුණේ, මේ අන්ධකාරයේ වුව, ඉටිපහන් ආලෝකය දීප්තිමත් අන්දමින් පරාවර්තනය කළේ සාමාන්‍ය වීදුරු තුළින් පවා මිණිකැට බඳු දිස්නයක් උපදවමිනි.

www.musesbooks.com

Copyrighted Material



එනමුදු, මේ කවර කලාංගයක් වුව, අල්තාරයට පිටුපසින්, වීදුරු හා ලෝහ තහඩු තුළ දමා යතුරු ලා තිබුණු, රනින් සරසන ලද ශව මංජුසා, එනම් ගල් මිනීපෙට්ටි තරම් අලංකාරවත් වූයේ නැත! විශාල ට්‍රංක පෙට්ටියක ප්‍රමාණයෙන් මෙන්ම, දෙව්මැඳුරේම ක්ෂුද්‍ර රුවක හැඩයෙන් යුතුව දෙව්මැඳුර මධ්‍යයේ ඉදිකොට තිබුණු ඒ දැවැන්ත ධාතු ගර්භය, එහි තිබූ සියල්ල අතරින් මෙතෙකැයි කිව නොහැකි භක්තියේ මෙන්ම කලාවේද කේන්ද්‍රය වී තිබිණි. දෙව්මැඳුරේ අතිශය පූජනීය ධාතුන්ට නිසි ආරක්ෂාව සැලසී තිබුණේ මෙහිය. තනි රත්‍රනින් නිමවා තිබුණු එය, දේවස්ථානයේ බිම් සැකසුම් කාලයේම තනවන ලද්දකැයි සිතිය හැකි විය. දහ තුන්වැනි සියවසේ විසූ වර්ඩුන්හි නිකලස් නැමැත්තෙකු විසින් සැලසුම් කර තිබුණු එය, මධ්‍යකාලීන රන්වැඩ කලාවේ සුහුරු බව පෙන්වන, මිහිපිට ඇති හොඳම සාක්ෂ්‍ය බවට පත්ව තිබිණි.

ජේසන්ගේ මේ කෙළවරක් නැති විපරම් කිරීම අතරේ දේවමෙහෙයද අවසානයක් කරා ළඟා වී ඇති බැව් හඟවන සීනු හා යාච්ඤා හඬ නැඟෙන්නට විය. අන්තයේදී, ස්වාමීන්ගේ රාත්‍රි භෝජනය සංකේතවත් වන සත්ප්‍රසාද පාන් බෙදාදෙමින් සත්ප්‍රසාද පූජාව පිණිස මොහොත උදා විය. යේසුස් වහන්සේගේ මාංශය හා රුධිරය පිළිගැනීමේ අරමුණින් යුතුව රැස්ව සිටි බැතිමත්හු, හිඳගෙන සිටි බංකු පෙළවලින් නැඟී ප්‍රවේශ මාර්ග දෙසට ළඟා වූවෝය.

තම වාරය ළඟා වූ පසු, බංකුවේ හිඳගෙන සිටි අනෙක් පිරිසද සමඟ නැඟිටගත් මැන්ඩි, සිය අත ජේසන්ගේ සුරතින් ලිස්සාහැරියේ, "මම ඉක්මනින් එන්නම්," යැයි පවසමිනි.

තමා අසුන්ගෙන සිටි බංකුව හිස්ව, අල්තාරය දෙසට යොමුවුණු පෝලිම ඉදිරියට ඇදී යන ආකාරය දෙස ජේසන් බලාසිටියේය. මැන්ඩි ආපසු පැමිණෙන තෙක් නොසන්සුන් බවකින් පසු වූ හෙතෙම, නැඟිට්ටේ තම දෙපා දිගහැර හිරි-ඇරගන්නටය. ඒ නැඟීගත්වනම හේ තවත් මොහොතක් සිටියේ පාපෝච්චාරණ කුටියකට පසෙකින් වූ එක්තරා ප්‍රතිමාවක් දෙස උනන්දුසහගත බැල්මක් හෙළන්නටය. එවේලෙහි, එක පිම්මට තම තුන්වැනි කොකා-කෝලා කෑනයත් හිස් කිරීම ගැන ඔහු පසුතැවිලි වූයේ එසේ හිටගෙන සිටියදීමය. ඉනික්බිති ආපසු හැරුණු හේ, දේවස්ථානයේ ප්‍රවේශය දෙසට බැල්මක් හෙළීය. පල්ලියේ ගර්භයෙන් පිටත, පොදු විවේකාගාරයක් පිහිටා තිබුණේය.

අපේක්ෂාසහගතව මෙසේ බලාසිටි ජේසන්, පිටුපස තිබුණු සෑම දොරකින්ම පාහේ එහි ඇතුළුවෙමින් සිටි පූජක කණ්ඩායමක්

MusesBooks®
www.musesbooks.com

Copyrighted Material



දුටු පළමුවැන්නා විය. පාදාන්තය දක්වා දිගු වූ කළු ලෝගුවලින් සැරසීගෙන, හිස් ආවරණය කොට, තද බඳපටියක් ඉණ වටා දවටාගත් ඔවුන් දුටු ජේසන්ට එසැණින් වැටහීගියේ මෙහි යම් අමුත්තක් - නොගැළපීමක් තිබෙන බවය. ඉතා යුහුසුලුව ඇඳුණු ඔවුහු, යම් යුද හුරුවකින් යුතු බවක් පෙන්වමින්, සෙවණැලි අතර සැඟවගියෝය.

*ඒ මේ දේව මංගල්ලයේම අවසන් අංගයකට සූදානමක්ද?*

වටයක් කැරකී දේවස්ථානය හාත්පස ඉක්මන් බැල්මක් හෙළූ ජේසන් දුටුවේ අනෙක් දොරටුවලද, රැහැන් ඇද අවුරා තිබුණු හරස් අංශයේ පැතිවලද, තව තවත් අර අන්දමේ කළු ලෝගුකාරයන් රැඳීසිටි අන්දමය. භක්තිය පෙන්වන ආකාරයෙන් හිස නවාගෙන සිටි විට පවා බාහිරට ඔවුන් පෙනුණේ යම් රැකවලක යෙදෙන්නන් පිරිසක් මෙනි.

*සිදුවන්නට යන්නේ කුමක්ද?*

මැන්ඩි අල්තාරය අසල සිටගෙන සිටි අයුරු ඔහු දුටුයේය. එවේලෙහි ඇය සිටියේ තම සත්ප්‍රසාද කොටස ලබාගනිමිනි. ඇයට පිටුපසින් සිටියේ තවත් බැතිමතුන් කිහිපදෙනෙකු පමණකි. *'දෙවියන් වහන්සේගේ මාංශය හා රුධිරය,'* ඔවුන්ගේ දෙතොල කියවාගන්නට පවා ජේසන්ට හැකි විය.

*ආමේන්,* ඔහු තමාටම කියාගත්තේය.

දිව්‍ය සත්ප්‍රසාදය අවසන් විය. මැන්ඩි ඇතුළු අවසන් බැතිමතුන් කීපදෙනාද ආපසු සිය අසුන් කරා පැමිණ තිබිණි. ඇයට අත වනමින් බංකු පෙළ දෙසට සන්කළ ජේසන්, ඉනික්බිති ඇය අසලින් හිඳගත්තේය.

"කවුද අර අමුතු පූජකවරු?" ඔහු ඇසුවේ ඉදිරියට නැඹුරුවෙමිනි.

ඇය දණගසාගෙන සිටියේ හිස පහතට හරවාගෙනය. ඊට ඇගේ එකම පිළිතුර වූයේ, මොහොතක් නිහඬවන ලෙස සන්කළ 'සූ' හඬ පමණකි. ඔහු ආපසු හිඳගත්තේය. බොහෝමයක් බැතිමත්තුද එයාකාරයෙන්ම හිස පහතට නවා දණ බිම ඔබාගෙන සිටියෝය. ජේසන් මෙන්ම, දිව්‍ය සත්ප්‍රසාදය ලබා නොගත් ඉතා සොච්චම් පිරිසක් පමණක් එයාකාරයෙන් තම අසුන්වලම හිඳගෙන සිටියෝය. ඔවුනට ඉදිරියෙන්, එක් පූජකයෙකු සත්ප්‍රසාද පූජාවේ අඩුම කුඩුමත් කළමනාත් අස්පස් කර දමමින් සිටියදී, ඉහළට එසැවුණු අසුන මත හිඳගෙන සිටි වයෝවෘද්ධ අගරදගුරු තැන නිදිකිරා වැටෙමින් සිටියේ ළය මත හොවාගත් නිකටින් යුතුවය.

www.musesbooks.com

Copyrighted Material



මෙතෙක් වේලා ජේසන්ගේ සිත තුළ වූ භක්තියත් - අද්භූත බව කැටිවුණු ඒ හැඟීමත් නැත්තටම නැති තැනට සිඳී - වියැකීගොස් තිබිණි. බාගවිට ඒ ඔහුට දැනුණු දැඩි මූත්‍ර බර නිසා වන්නටද ඉඩ තිබුණු අතර, ඔහුට දැන් ඇවැසි වී තිබුණේ හැකි ඉක්මනින් මෙතැනින් පිටතට යාගන්නටය. එපමණක්ද නොව, ඉක්මන් කරවනු පිණිස ඔහු මැන්ඩිගේ වැළමිටින්ද ඇද්දේය.

එහෙත් ඉදිරියෙන් සිදු වූ යමක් ඔහු නවතාලූයේය. අල්තාරය දෙපස සිටි පූජකවරු තම රෙදි-පෙරෙදි අස්සේ සඟවාගෙන සිටි ගිනිඅවි ඉවතට ඇදගත්තෝය. ඒවායේ තෙල්ගල්වන ලද ලෝහ බඳ ඉටිපහන් එළියෙන් දිලිසුණේ, ඒවා දිගු සයිලන්සර සවිකරන ලද ඌසි[4] ගිනිඅවි බව හෙළිදරව් කරමිනි.

පුරුද්දක් හැටියටම දුම්පානය කරන්නෙකුගේ දිගු කැස්සක හඬ නොපැරදූ සිහින් හඬක් නිකුත් කරමින්, අල්තාරය දෙපසින්ම වෙඩි හඬ ඇදී ආවේය. බංකු පෙළවල පහළට නැවී තිබුණු හිස් වහා ඉහළට එසැවිණි. සුදු පැහැයෙන් සැරසී, අල්තාරයට පිටුපසින් සිටි පූජකයා ඒ හඬට අනුරූපව ගැහෙන්නට විය. දැන් ඔහු පෙනුණේ, තීන්ත බෝල ක්‍රීඩාවේදී තද රත් පැහැ තීන්ත බෝල වැදීමෙන් රත් පැහැ කැවෙකු මෙනි. තවත් මොහොතකින් පූජකයා අල්තාරය මත ඇදවැටුණේ තම ලෙයත්, ඒ මත තිබුණු බඳුනේ රතු පැහැ වයිනුත් සමෝසමේ විසුරුවා හරිමිනි.

තක්කුමුක්කු වී ගිය නිහැඬියාවකින් පසුව, දැන් බැතිමතුන් අතරින් නැඟී ආයේ උස් විලාපයකි. මිනිස්සු නැඟීගත්තෝය. උස් අසුනෙන් බිම ඇදවැටුණු වයෝවෘද්ධ අගරදගුරු තැන දණ පණ ගා නැඟිටගත්තේ භීතියෙන් මුසපත් වෙමිනි. මේ තදබල තිගැස්මෙන් ඔහුගේ අගරදගුරු හිස්වැස්ම බිමට විසිවී ගියේය.

හැම අතකින්ම දිව ආ පූජකවරු ප්‍රවේශ මාර්ග පුරා විහිද, විසිරී ගියෝය. ඉංගිරීසියෙන්, ප්‍රංශ බසින් හා ජර්මානු බසින් අණකිරීම් නිකුත් වූයේ ගිගුරුම් දුන් හඬිනි.

*Bleiben Sie in Ihren Sitzen…Ne bouge pas…*

වැසීගිය හිස්වලට යටින් පැලඳි, කළු සේද අඩ මුහුණු ආවරණය හරහා නැඟී ආයේ ඇවිරුණු - බොල් ගතියක් පෑ හඬය. එහෙත් ඉහළට එසැවුණු ගිනිඅවි ඒ නියෝග හඬ යටපත් කර දමා තිබිණි.

*ඉඳගෙන හිටපල්ලා! නැතිනම් මැරුම්කාපල්ලා!*

4 *snub-nosed Uzi*

MusesBooks®
www.musesbooks.com

Copyrighted Material



මැන්ඩි, ජේසන් සමග යළි හිඳගත්තාය. ඇගේ අත ඔහුගේ සුරත සොයා ඇදී විත් තිබිණි. ඇගේ අතැඟිලි තදින් සිරකරගත් ඔහු වටපිට බැලූයේ ඇසිපිය හෙළන්නට පවා නොහැකිවය. සෑම දොරටුවක්ම පාහේ වැසී, රැකවල් යෙදී තිබිණි.

*මේ සිදුවන්නේ කුමක්ද?*

ප්‍රධාන පිවිසුම අසල පොදිගැසී සිටි සන්නද්ධ පූජකවරුන් අතරින් තවත් එබඳුම, එහෙත් සෙස්සන්ට වඩා උසින් පමණක් වෙනස් තැනැත්තෙකු මතුවූයේ, යම් කැඳවීමක් ලදොත් ඉදිරිපත් වන්නට මෙනි. ඔහුගේ ලෝගුව වඩා සමානකමක් පෙන්වූයේ කබායකටය. යම් නායකයෙකු වන්නට ඇතැයි ඉඟි පෙන්නූ හේ, එඩිතර විලාසයෙන් දේවස්ථානය මැද ප්‍රවේශ මාර්ගය ඔස්සේ ඉදිරියට ඇදුණේ නිරායුධවමය.

ඔහු අල්තාරය අසලදී අගරදගුරුතුමන් මුණගැසුණේය. ඔවුන් දෙදෙනා අතර හටගත්තේ උණුසුම් වාග් සංග්‍රාමයකි. ඔවුන් දෙදෙනා කතාකරමින් සිටියේ ලතින් භාෂාවෙන් බැව් වටහාගන්නට ජේසන්ට සුළු මොහොතක් ගත විය. එකවරම අගරදගුරු පිටුපසට විසිවී ගියේ බියෙන් මුසපත්වය.

කණ්ඩායම් නායකයා පසෙකට ඇදුණේය. මිනිසුන් දෙදෙනෙක් ඉදිරියට ඇවිද ආවෝය. ගිනිඅවි හඬ නඟන්නට විය. එහෙත් මේ ගිනිඅවි මෙවේලෙහි මනුෂ්‍ය ඝාතනයක් පිණිස එල්ල වූයේ නොවේ. ඔවුන් වෙඩි තැබුවේ අර රත්රන් කරඬුව[5] මුද්‍රා තබා තිබුණු ආරක්ෂිත මුහුණතටය. ඉරිතැළී යන්තම් ඇතුළට කිඳාබැස්සේ වුව, වීදුරුව බිඳීගියේ නැත. එය වෙඩි නොවදින වීදුරුවක් විය.

"හොරු..." ජේසන් මිමිනීය. එය වූ කලි, අපූරුවට සැලසුම් කරන ලද මංකොල්ලයක් විය.

වීදුරු තහඩුවේ සවිමත් බව අවබෝධ වීමෙන් නව පණක් උපදවාගත් අගරදගුරු තැන යළි දෙපයට වාරුගත්තේය. අර පූජක නඩයේ නායකයා ඔහු දෙසට අතක් පාමින් යමක් පැවසූයේ ලතින් බසිනි. එහෙත් අගරදගුරු තැන හිස දෙපසට සැලීය.

*"Lassen Sie dann Blut Ihrer Schafe Ihre Hände beflecke,"* එවර මිනිසා පැවසූයේ ජර්මානු බසිනි. *'උඹේ බැටළුවන්ගේ ලේ උඹේ අත්වලම තැවරිච්චාවේ!'*

5 *reliquary* - කතුවරයා ඇතැම් තැනක *sarcophagus* (දෙණ/ශව මංජුසාව) යන හැඳින්වීමද මේ සඳහා යොදාගෙන ඇති බව පෙනේ

MusesBooks®
www.musesbooks.com

Copyrighted Material



දැන්, නායකයා තවත් මිනිසුන් දෙදෙනෙකු ඉදිරියට කැඳවීය. ධාතු ගර්භය දෙපසින් සිටගත් ඔවුහු, බරති ලෝහ තැටි දෙකක් ඉහළට ඔසොවාගත්තෝය. ඉතා ඉක්මනින් කාරිය ඉටුවිය.

කිසිවෙකුගේත් ඇස නොගැටී හමා ආ මහ සුළඟකින් තෙරපී ගිය කලෙක මෙන්, වෙඩි පහරින් දුබලව ගොස් තිබුණු ආරක්ෂක වීදුරුව පිටතට පුපුරා ගියේය. සැලෙන ඉටිපහන් එළියෙන් ශෛලමය දෙණ දිලිසුම් දුන්නේය. දේවස්ථානයේ බිත්ති සියල්ල ඇතුළතට බරවෙමින්, තෙරපෙමින්, සියල්ල පොඩිපට්ටම් කර දැමෙන තරමේ පීඩනයක් ජේසන්ට හිටිහැටියේ දැනුණේ ඔහුගේ දෙසවන් තුළ යම් සිහින් පිපිරුම් හඬක් ඇති කරමිනි. ඒ පීඩනය ඔහුගේ දෙසවන බිහිරි කළ බවක් දැනිණ; පෙනීමද පටු වී සිහින් වී ගියේය.

ඔහු වහා හැරුණේ මැන්ඩි දෙසය.

අල්ලාගත්වනම තවමත් ඇගේ අත ඔහුගේ අතේ සිරවී තිබුණේ නමුදු හිස පසුපසට නැවී මුව ඇදී විවරව ගොස් තිබිණි.

"මැන්ඩි."

දෑස් කොනින් අවට බැලූ ඔහු දුටුයේ අනෙක් බැතිමතුන්ද එවැනිම පීඩාකාරී ඉරියව්වකට වැටී සිටි අයුරුය. ඔහුගේ අතේ සිරවී තිබුණු මැන්ඩිගේ අත දැන් සිහින් වෙවුලීමකට පටන්ගත්තේ, ස්පීකරයක සියුම් හඬ උපදවන 'ට්වීටරය' නම් කොටස දෙදරන්නා හා සමාන අන්දමකිනි. ඔහු බලාසිටියදීම ලේ රතට හැරුණු ඇගේ මුහුණ දිගේ කඳුළු කඩාහැලිණ. ඇය හුස්මගත්තේ නැත. ඉනික්බිති ඇගේ සිරුර ගැස්සී, දරදඬු වී ඔහුගේ ග්‍රහණයෙන් මිදුණේ, ඊට පෙර ඇගේ ඇඟිලිතුඩු අගින් දිවගිය යම් විද්‍යුත් කම්පනයක් ඔහුගේ අතට දැනෙන්නට හරිමිනි.

තවදුරටත් හිඳගෙන ඉන්නට නොහැකි තරම් භීතියට පත් හේ නැඟිට්ටේය.

විවර වූ මැන්ඩිගේ මුව තුළින් කළු පැහැ දුම් දහරක් පිටතට ඇදෙමින් තිබිණි.

ඇගේ ඇසේ කළු ඉංගිරියාව අතුරුදන්ව සුදු පැහැය පමණක් ඉතිරිව තිබුණු නමුදු, ඇස් අගින්ද අර කළු පැහැ දුමාරය නැඟෙමින් තිබිණ.

ඇය මියගොසිනි!

භීතියෙන් ගොළු වී ගිය මුවින් යුතුව ජේසන් දේවස්ථානය පුරා සිය දෑස යොමුකළේය. හැමතින්ම දැකගන්නට ලැබුණේ එබඳු

MusesBooks

www.musesbooks.com

Copyrighted Material



දර්ශනමය. කිහිපදෙනෙකු පමණක් එයින් ගැලවී සිටිනු පෙනිණ. තම දෙමාපියන්ට මැදිවුණු කුඩා දරු දෙදෙනෙක් හඬමින්, විලාප තබමින් සිටියෝය. මේ විපත්තියෙන් බේරී සිටින්නේ කවුරුන්දැයි ජේසන් මෙවේලෙහි වටහාගත්තේය. ඒ අර සත්ප්‍රසාදය ලබා නොගත්තවුන්ය.

ඔහුද එබඳු තැනැත්තෙක් වීය.

හේ, බිත්තියේ නැඟුණු සෙවණැල්ල අතරට වැදුණේය. ඔහු එතැනින් එහාමෙහා වනු කිසිවෙකුගේ ඇසගැටුණේ නැත. බිත්තියේ ඇතිල්ලී ඇදුණු ඔහුට කිසිවෙකු විසින් රැකවල් නොයොදන ලද දොරටුවක් හමු විය. එහෙත් එය සැබෑ දොරටුවක් වූයේ නැත.

දොර පියන ඇද විවර කරගත් ජේසන් ලිස්සා ගියේ පාපෝච්චාරණ කුටියක් තුළටය. දණින් වැටී ගුළිගැසී බිමට පහත් වූ හේ අත් බැඳගත්තේය.

යාච්ඤාවක් ඔහුගේ දෙතොලග මතු විය.

අන්තයේදී, හිටිහැටියේම වාගේ අර පීඩනය අවසන් විය. ඔහුට එය දැනුණේ හිස ඇතුළිනි. සිහින් පිපිරුම් හඬ. පීඩනය ලිහිල් වී යාමක්. දේවස්ථාන බිත්ති යථා තත්වයට පත් විය.

ඔහු සිටියේ හඬමිනි. කඳුළු, ඔහුගේ දෙකම්මුල් සීතල කරමින් රූරා හැලුණේය.

හේ පාපෝච්චාරණ කුටියේ තිබුණු සිදුරකින් එබිකම් කර බැලූයේ අවදානමක් ගනිමිනි.

දෙව්මැඳුරේ ගර්භයත් අල්තාරයත් එතුළින් පැහැදිලිව දැකගන්නට ලැබුණු හෙයින්, ජේසන් ඒ දෙස දෙනෙත් අයා බලාසිටියේය. වාතය, හිසකෙස් පිලිස්සෙන ගඳින් පිරීගොස් තිබිණි. කැගැහිල්ලත් වැලපිල්ලත් තවමත් දෝංකාර දුන් නමුදු, ඒ හඬ දැන් නැඟී ආවේ එහෙන් මෙහෙන් කෙනෙකු දෙන්නෙකුගේ මුවිනි. ඒ තවමත් පණ නොනැසී සිටියවුන්ය. එක් මිනිස් රුවක්, ටක්කෙටම කිවහොත් පදිකවේදිකාවේ ජීවත් වූ, වැරහැලි ඇඳුමින් ගත වසාගත් තැනැත්තෙක් පය පැකිළී පැකිළී බංකු පෙළින් පැන, පැති ප්‍රවේශ මාර්ගය ඔස්සේ පහළට දුවන්නට විය. ඔහුට පියවර දහයක්වත් දිවයන්නට ලැබුණේ නැති, හිස පිටුපසට එල්ල වූයේ වෙඩි පහරකි. එකම එක වෙඩි පහරක් පමණක්. ඔහුගේ සිරුර බිම ඇදවැටිණි.

*දෙවියනි... අපොයි දෙවියනි!*

අසීරුවෙන් ඉකිබිඳුම වළකාගත් ජේසන්, සිය දෙනෙත් අල්තාරය වෙත යොමුකළේය. කළු පැහැ හැඳගත් පූජකවරු සතරදෙනෙක් බිඳී

MusesBooks®

www.musesbooks.com

Copyrighted Material



කුඩුපට්ටම් වී ගිය ආවරණය තුළ තිබුණු, රනින් සරසන ලද කරඬුව ඉහළට එසවූවෝය. එතැන වැටී තිබුණු මරාදැමුණු පූජකයාගේ සිරුර පා පහරකින් එපිටට ඇදී යද්දී, කරඬුව එතැනින් තැබිණ. සිය ලෝගුවට අත දැමූ නායකයා ඉන් පිටතට ඇදගත්තේ විශාල ප්‍රමාණයේ රෙදි මල්ලකි. ඉනික්බිති, කරඬුව වැසූ පියන ඉවත් කළ පූජකවරු එහි ඇතුළත තිබුණු දේ උක්ත කී මල්ල තුළට වැටෙන්නට සැලැස්සුවෝය. එය හිස් වී ගිය වහාම, වටිනාකම මෙතෙකැයි කිව නොහැකි වූ රනින් කළ දෙණ පසෙකට පෙරළා දැම්මේ, මහ හඬක් නංවමින් ඉවත විසිවී වැටිණ.

මෙසේ සොරාගත් පූජනීය ධාතු හා අවශේෂ මල්ලේ බර කර තබාගත් නායකයා ප්‍රධාන ප්‍රවේශ මාර්ගය ඔස්සේ ආපසු ඇදෙන්නට පටන්ගත්තේය.

අගරදගුරු තැන ඔහුට කෑගැසුවේය. ඒ නැවතත් ලතින් බසිනි. එය සාප කිරීමක ස්වරයක් ගත්තේය.

ඊට ලද එකම ප්‍රතිචාරය වූයේ එක් තැනැත්තෙකුගේ සුරත සැලීමක් පමණි.

අගරදගුරු තැනගේ පසුපසට පැනගත් ලෝගුකාරයන්ගෙන් එකෙක් පිස්තෝලයක් ඔසොවා ඔහුගේ හිස පිටුපසට ඉලක්කය ගති.

ජේසන් නිහඬවම ඉවත හැරී හිස නවාගත්තේ තවදුරටත් එය දකින්නට කොහෙත්ම නොකැමැති වූ බැවිනි.

ඔහු තම දෙනෙත වසාගත්තේය. තවත් වෙඩි හඬ කීපයක්ම දේවස්ථානය සිසාරා නැගුණේය. ඒ කඩින් කඩය. විලාප, හිටිහැටියේම අතුරුදන් විය. ජීවතුන් අතර සිටි ඉතිරි කීපදෙනාටද වෙඩි තබා දැමීමෙන් පසුව දේවස්ථානය වසාදැමුණේ මරණයේ අන්ධකාරය ගලා එන්නට ඉඩ සලසමිනි.

තවදුරටත් සිය දෑස් වසාගෙන සිටි ජේසන් යාච්ඤා කළේය.

ඊට මොහොතකට පෙර, පූජක කණ්ඩායමේ නායකයා ඇඟලා සිටි පිටත ලෝගුව මත තිබුණු ලාංඡනයක ඡායාවක් දැකගන්නට ජේසන් සමත්ව සිටියේය. හේ සිය දෙඅත් ඔසොවද්දී කළු පැහැ ලෝගුව යන්තමින් දෙපසට ඇදීගියේ, තද රත් පැහැ සලකුණක් නිරාවරණය වන අන්දමිනි. ඒ, තමාගේම ගෙල වටා එතීගිය වලග කොටසකින් යුතුව දඟරගැසුණු මකර රුවක් විය. ඒ කුමන සලකුණක්දැයි ජේසන්ට නිච්චි නොවූ නමුදු, එය යුරෝපීය ලක්ෂණවලට වඩා එහා ගිය පර්සියානු ගතියක් පෙන්වූ ආගන්තුක ලකුණක් විය.

www.musesbooks.com

Copyrighted Material



පාපෝච්චාරණ කුටියෙන් එපිට දෙව්මැඳුර ගිලීගොස් තිබුණේ මරණීය නිහැඬියාවකය.

උස් පාවහන් පැලඳ, අඩි තබා එන බර හඬක්, තමා සැඟවී සිටි තැනට ළඟාවෙමින් තිබෙන බවක් ඔහුට ඇසිණි.

ඔහු කිටි කිටියේම තම දෙනෙත වසා තද කරගත්තේ උපන් භීතියෙනුත්, මේ ශුද්ධවස්තු කෙලෙසීමේ අපරාධය සැබෑවටම සිදුවූයේ යැයි විශ්වාස කරන්නට නුපුළුවන් වූ හැඟුමිනුත් යුතුවය.

*අස්ථි පිරවූ මල්ලක් වෙනුවෙන් මේ සා අපරාධයක්!*

මේ දේවස්ථානය ඉදිවී තිබුණේ එකී පූජනීය අස්ථි වෙනුවෙනි. මෙතෙකැයි කිව නොහැකි තරම් රජවරුන් ගණනාවක් ඊට හිස නවා තිබෙන්නද ඇත. සැබැවින්ම මේ මංගල්‍යය - රජවරුන් තිදෙනා බැහැදැකීමේ මංගල්‍යය පවා පවත්වන්නට යෙදුණේ එකී මෙකී බොහෝදෙනා සිහිකරනු පිණිස වන්නට ඉඩ තිබිණි. එහෙත් ජේසන්ගේ හිතේ හොල්මන් කළ පැනය මේ කිසිවක් නොවේ.

*ඇයි?*

ශිලා පුවරුවක, රනින් මෙන්ම වීදුරු තැටි මතද දේවස්ථානය පුරා පෙර කී රජවරුන් තිදෙනාගේ රූ සිත්තම් කර තිබුණේය. ඉන් එක් කැටයමක තිබුණේ, බෙත්ලෙහෙම් තාරකාවේ මඟපෙන්වීම් අනුව යමින් ප්‍රඥාවන්තයන් තිදෙනා කාන්තාරය හරහා ඔටුවන් දක්කාගෙන ගමන්කරන අයුරුය. තවත් එකක තිබුණේ, ජේසු බිළිඳාට ගෞරව කරනු පිණිස දණ බිම තබාගත් මිනිසුන් පිරිසක් රත්රන්, කට්ටකුමංජල් හා සුවඳ ලාටු ආදිය පූජාකරන අන්දමය.

එහෙත් මේ කිසිවකට ජේසන්ගේ මනසේ ඉඩ ලැබුණේ නැත. ඔහුගේ සිත මැවුණු - සිත නැඟුණු එකම දෙය වූයේ මැන්ඩිගේ සිනහවය. ඇගේ මෘදු ස්පර්ශයය.

*ඒ සියල්ල අවසන්ය.*

උක්ත කී උස් පාවහන් හඬ, ඔහු රැඳී සිටි කුටියට පිටතින් නතර විය.

මේ මහා සංහාරය සිදුකළේ ඇයිදැයි පිළිතුරු සපයන ලෙස අයදිමින් හේ රහසේ හඬාවැටුණේය.

*ඇයි?*

ජේසුස් වහන්සේ සොයා ආ ප්‍රඥාවන්තයන් තිදෙනාගේ අස්ථි මෙයාකාරයෙන් සොරාගත්තේ ඇයි?

www.musesbooks.com

Copyrighted Material

# පළමුවැනි දිනය

MusesBooks®

www.musesbooks.com

Copyrighted Material

# 1

# අනුනවයෙන් බේරීම

**ජූලි 24, පෙ.ව. 4:34**
**ෆ්‍රෙඩ්රික්, මේරිලන්ඩ්**

කඩාකප්පල්කරු පැමිණ සිටියේය.

ඩෙට්‍රික් බලකොටුවේ හදවත බඳු වී යැයි කිවහැකි වූ අඳුරු ගොඩනැගිලි අතරින් ග්‍රේසන් පියර්ස් සිය යතුරුපැදිය පදවමින් සිටියේය. ඔහු එයට හෙමින් ඉදිරියට ඇදෙන්නට ඉඩ දී තිබිණි. එහි විද්‍යුත් එන්ජිමෙන් නිකුත් වූයේ ශීතකරණයක මෝටරයකින් නැගෙන හඬටත් අඩු හඬකි. ඔහු පැලැඳි කාළ වර්ණ අත්වැසුම්, යතුරුපැදිය පින්තාරු කර තිබුණු නිකල්-පොස්පරස් සංයෝගයක් වූ '*NPL* සුපර් බ්ලැක්' තීන්තය හා කදිමට පැහිණ. එය වැඩිමනත් දෘශ්‍ය ආලෝකය උරාගත්තේ සාමාන්‍ය කාළ වර්ණය ඉතා පැහැදිලි දිස්නයකින් යුතුව පෙනෙන්නට සලස්වමිනි. ඔහු හැඳ සිටි, මුළු සිරුරම ආවරණය වන තනි ඇඳුමද, සවිමත් හිස්වැස්මද ඊටම සමාන වන සේ අඳුරු කර තිබුණේය.

වකුටු වී යතුරුපැදිය මත ගමන් කළ හේ, දැන් ඒ පටු වීදියේ කෙළවරකට ළංවෙමින් සිටියේය. මේ වීදි කෙළවර එක්තරා එළිමහන් අංගණයක් තිබුණේ, අඳුරු පැල්ලමක් ලෙසින් පෙනුණු එහි, ගඩොලින් කළ ගොඩනැගිලි දෙකක් මුහුණට මුහුණ පිහිටා තිබුණේය. ඉන් එකක් ජාතික පිළිකා මර්දන ආයතනය වූ අතර, අනෙක *USAMRIID*[1]

1 *United States Army Medical Research Institute of Infectious Diseases*

www.musesbooks.com

Copyrighted Material



යන කෙටි නමින් හඳුන්වන ලද බෝවන රෝග පිළිබඳ අමෙරිකානු හමුදා වෛද්‍ය පර්යේෂණ ආයතනයයි.

එය වර්ග අඩි හැටදහසක බිමක් වසා පැතිර තිබුණේ, අන්තරායක ද්‍රව්‍ය සඳහා ආරක්ෂණ ක්‍රමවේද පිළිබඳව කටයුතු සිදු කළ එහි විද්‍යාගාර තුළ රටේ ජෛව ත්‍රස්තවාදයට එදිරිව සංග්‍රාමයක් ක්‍රියාත්මකව පැවතිණි.

එන්ජිම නතර කළ හේ, තවත් මොහොතක් යතුරුපැදියේ අසුන මතම හිඳගෙන සිටියේය. ඔහුගේ වම් දණහිසේ ගැව් ගැවී තිබුණේ බෑගයකි. ඩොලර හැත්තෑ දහසක් එහි විය. එළිමහන් බිම මඟහැර, ඔහු මේ පටු වීදිය තුළටම වී සිටියේය. වැඩිමනත්ව හේ අඳුර ප්‍රිය කළේය. සඳ බැසගෙන යන්නට සෑහෙන කාලයක් ගත වී තිබුණු අතර, තවත් මිනිත්තු විසිදෙකක්වත් ගතවන තෙක් හිරු නැඟ නොඑන බවද නියත විය. පෙරදා රාත්‍රියේ හටගත් ගිම්හාන කුණාටුවේ අවශේෂවලින් තරු රෑනද වැසී, සැඟවගොස් තිබිණි.

*ඔහුගේ ප්‍රයත්නය සාර්ථක වේද?*

ගෙල රැඳවූ මයික්‍රෆෝනයට ඔහු කතාකළේ කේත භාෂාවෙනි. "කොටළුවාගෙන් රාජාලියාට - අදාළ තැනට ළඟා වුණා. පයින්ම ඉදිරියට ඇදෙන්නයි සූදානම."

"පැහැදිලියි. චන්ද්‍රිකා හරහා අපට ඔබ දැකගන්නට පුළුවනි."

ඉහළ අහස බලා අතක් වැනීමේ ආශාව ඔහු මැඩගත්තේ ඉතා අසීරුවෙනි. තමා දෙස සැඟවී බලා නිරීක්ෂණය කිරීම ඔහු කිසිකලෙකත් ප්‍රිය නොකළ නමුදු, මේ වූ කලි ඉතා වැදගත් ගනුදෙනුවක් විය. මේ හමුව තනිපංගලමේ සිදු කරන්නට අවසර ලබාගන්නටද ඔහු සමත්ව සිටියේය. ඔහු සබඳතාවක් ගොඩනඟා ගන්නට සමත්ව සිටි මේ තැනැත්තා සැබැවින්ම කලබලකාරයෙකු - ඉතා ඉක්මනින් කලබලයට පත්වන්නෙකු විය. ලිබියාව හා සුඩානයේ කටයුතුවල අතරමැදියෙකු ලෙස කටයුතු කරමින් මේ මහඟු අවස්ථාව උදාකර ගන්නට ඔහු හය මසක කාලයක් වෙහෙසී තිබිණි. එය කොයි ලෙසකින් හෝ පහසු කාරියක් වී තිබුණේ නැත. මුදල් තිබුණු පළියට විශ්වාසය ගොඩනඟා ගන්නට හැකි වූයේද නැත. *විශේෂයෙන්ම මෙබඳු කටයුත්තකදී.*

මුදල් බෑගය වෙත පහත් වූ ඔහු එය තම උරයේ එල්ලාගත්තේය. බොහෝ පරීක්ෂාකාරී ආකාරයෙන් තම යතුරුපැදිය අඳුරු මුල්ලකට තල්ලු කරගෙන ගිය හේ, එය එහි නතර කළේය.

www.musesbooks.com

Copyrighted Material



ඉනික්බිති පටු වීදිය හරහා පහතට ඇවිද ගියේය.

මේ හෝරාවේ ඇස් කීපයක්ම අවදියෙන් වූ නමුදු ඉන් වැඩිමනත් ඒවා ඉලෙක්ට්‍රොනික උපාංග විය. 'ඕල්ඩ් ෆාම් ගේට්' නමින් හැඳින්වුණු, සේවකයන්ට ගොඩනැගිල්ලට ඇතුළුවීම පිණිස වූ දොරටුව අසලදී සිදු කරන ලද හඳුනාගැනීමේ පරීක්ෂාවෙන් ඔහු වැඩි කරදරයක් නැතිවම සමත් වූයේය. ඉනික්බිති ඔහුට බලාසිටින්නට සිදුවූයේ, තමා විසින් යොදන ලද කූට උපක්‍රම, ඉලෙක්ට්‍රොනික ආවේක්ෂණ මඟහැර යන්නට තරම් කාලයක් ලබාදෙනු ඇතැයි අපේක්ෂාවෙන් සිටින්නටය.

හේ, කිමිදුම්කරුවන් පලඳින, දිස්නය සහිත මුහුණකින් යුතු බ්‍රෙයිට්ලිංග් අත්ඔර්ලෝසුව දෙස බැලීය. 4.45. තවත් මිනිත්තු පහළොවක් ගෙවීගිය තැන, හමුව පැවැත්වීම සඳහා කටයුතු සූදානමිනි. එහිදී ඔහු ලබන සාර්ථකත්වය මත බොහෝ දේ තීන්දු වන්නට ඉඩ තිබිණි.

ග්‍රේ සිය ගමනාන්තයට ළඟා වූයේය. ඒ 470 ගොඩනැගිල්ලය. ඊළඟ මාසයේ කඩා බිඳ හෙළන්නට තීන්දු වී තිබුණු ගොඩනැගිල්ලක් බැවින් දැන් එය පාළුවට හැරී තිබිණි. අඩු ආරක්ෂාවක් - විපරමක් සැපයුණු මේ ගොඩනැගිල්ල මෙබඳු හමුවක් සඳහා සෑම අතින්ම පාහේ සුදුසු බවක් පෙනුණද, මේ ස්ථානයම ඒ සඳහා තෝරාගැනීම තුළ යම් විකාරරූපී හාස්‍යජනක බවක්ද ගැබ්ව තිබිණි. හැටේ දශකයේදී මේ ගොඩනැගිල්ල තුළ තිබුණු සුවිසල් කටාරම් හා ටැංකිවල ඇන්ත්‍රැක්ස් බැක්ටීරියා වර්ධනය වන්නට හැර තිබුණු අතර, 1971 වසරේදී යළිත් වර්ධනය කළ නොහැකි අන්දමින් විනාශයට පත් ඒ විෂ සහිත බැක්ටීරියා ගහන, එතැනින් මුළුමනින්ම ඉවත් කර තිබිණි. එවක්පටන් භාවිතයෙන් තොර ගොඩනැගිල්ලක් ලෙස පැවැති එය, පසු කලෙකදී පිළිකා මර්දන ආයතනයේ විශාල ගබඩා ඒකකයක් ලෙස යොදාගෙන තිබිණි.

එහෙත් නැවත වතාවක් ඒ වහල යටම ඇන්ත්‍රැක්ස් පිළිබඳ ගනුදෙනුවක් සිදුවන්නට නියමිත විය. හේ හිස ඔසොවා බැල්මක් හෙළීය. සියලු කවුළු තිබුණේ අඳුරේ වැසීගොසිනි. විකුණුම්කරු හමුවන්නට නියමිතව තිබුණේ එහි සිව්වැනි මහලේදීය.

පැති දොරටුවක් කරා ඇදුණු ඔහු, එහි අගුල විවර කරගත්තේ එහි සිටි ඔහුගේ තොරතුරු සපයන්නා විසින් ලබා දී තිබුණු ඉලෙක්ට්‍රොනික යතුරුපත ආධාරයෙනි. දැන් මේ ඔහුගේ උරහිසේ එල්ලෙමින් තිබුණේ පෙර කී මිනිසාට ගෙවිය යුතු ගාස්තුවේ දෙවැනි අඩ වූ අතර, පළමු

MusesBooks®
www.musesbooks.com